# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012

2015 සැප්තැම්බර් / ඔක්තෝබර්

ආර්ථික විද්‍යාව - **ECON –E 1025**

එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

### 1 කොටස - එංගලන්තයේ ආර්ථික ඉතිහාසය

01. බණ්ඩාරගම් ක්‍රමයේ ක්‍රියාත්මක සවරූපය පැහැදිලි කොට, බණ්ඩාරගම් ක්‍රමය බිඳ වැටීමට බලපෑ හේතු පරීක්ෂා කරන්න.

02. 'ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයන්හි ආර්ථික ප්‍රතිඵල යහපත් වුවත් සමාජීය ප්‍රතිඵල බොහෝදුරට අනර්ථකාරීය'. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. කාර්මික විප්ලවය ප්‍රථමයෙන් ම එංගලන්තයේ ඇතිවීමට බලපෑ හේතු සාධක පරීක්ෂා කරන්න.

04. 'එංගලන්තයේ දුම්රිය ප්‍රවාහන සංවර්ධනය මගින් දෙවන කාර්මික විප්ලවය රට තුළ නිර්මාණය කළේය.' යන ප්‍රකාශය කොතෙක් දුරට සාධාරණදැයි විමසන්න.

### 2 කොටස - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

05. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා මධ්‍යකාලීන වැඩවසම් සමාජ ආර්ථික ක්‍රමය බිඳ වැටීමෙ හි ලා කොතෙක් දුරට බලපෑවේ දැයි පැහැදිලි කරන්න.

06. 19 වන සියවසේ මැදභාගයේ දී ආරම්භ වී ව්‍යාප්ත වූ වැවිලි කර්මාන්තය හේතු කොට ගෙන දිවයින තුළ නිර්මාණය වූ සමාජ ආර්ථික විපර්යාසයන් පිළිබඳ ඇගයීමක් කරන්න.

07. දකුණු ඉන්දීය කම්කරුවන්ගේ පැමිණීම වැවිලි කර්මාන්තයේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස ඔබ පිළිගන්නේ ද යන්න උදාහරණ සමගින් පැහැදිලි කරන්න.

08. දේශීය යැපුම් කෘෂිකර්මාන්තය සම්බන්ධ බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කොට, 1930 න් පසු එම ප්‍රතිපත්තියේ ඇති වූ විශේෂිත වෙනස්වීම් දේශීය කෘෂිකර්මාන්තයේ දියුණුවට කොතෙක් දුරට බලපෑවේ දැයි විමසන්න.

***************************